සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

09 ශ්‍රේණිය | ක්‍රිස්තියානි ධර්මය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දේව සබඳතාවයෙන් වෙන් වූ මිනිසුන් අතරේ සිටි දැහැමි පුද්ගලයා වන්නේ,

    (1) ආබ්‍රහම් ය. (2) නෝවා ය. (3) පේදුරු ය. (4) සාකෙවුස් ය.

02. ඊශ්‍රායෙල් ජනතාවගේ ප්‍රථම රජු වන්නේ,

    (1) හෙරොද් ය. (2) සාමුවෙල් ය. (3) සාවුල් ය. (4) දාවිත් ය.

03. දෙවියන් වහන්සේ ඉදිරියේ ගුණවත් දරුවකු වීමට ඔබ කලයුතු දේ වන්නේ,

    (1) දෙවියන් වහන්සේට ප්‍රසන්නව ජීවත් වීමයි.
    (2) දෙවියන් වහන්සේට පුද පූජා ඔප්පු කිරීමයි.
    (3) නිතිපතා දේව මෙහෙයට සහභාගී වීමයි.
    (4) දෙවියන් වහන්සේගේ ක්‍රියාවලට අගෞරවය දැක්වීමයි.

04. කානාහි සරණ මංගල්‍යය ගැන සඳහන් වන සුභාරංචිය වන්නේ,

    (1) මතෙව් ය. (2) ජොහාන් ය. (3) ලූක් ය. (4) මාක් ය.

05. හාරදහසකට කෑම දීමේ දී ඔවුන්ට ලබා දුන් ආහාර වන්නේ,

    (1) රොටී හතයි මසුන් ස්වල්පය යි. (2) රොටී පහයි මසුන් දෙක යි.
    (3) රොටී හතයි මසුන් දෙක යි. (4) රොටී හතරයි මසුන් දෙක යි.

06. හාස්කම් අත්දැකීමට නම් අපතුළ තිබිය යුතු ගුණාංගය වන්නේ,

    (1) කීකරුකම ය. (2) ඇදහිල්ල ය.
    (3) බලාපොරොත්තුව ය. (4) ඥානය ය.

07. ස්වාමීන් වහන්සේගේ යාච්ඤාවේ දී කොන්දේසියක් සහිතව කළයුතු ඉල්ලීමක් වන්නේ,

    (1) අපගේ දවස්පතා ආහාරය ලබා දීමය.
    (2) වරදට කමාව ඉල්ලීමය.
    (3) පරීක්ෂාවට නොපමුණුවා නපුරාගෙන් මිදීමය.
    (4) උන්වහන්සේ කැමැත්ත ඉටු කිරීමය.

08. ශුද්ධ බයිබලයේ අඛණ්ඩව දිවෙන තේමාව වන්නේ,

(1) යහපත්කම ය. (2) කරුණාව ය. (3) ප්‍රේමය ය. (4) දයාව ය.

09. රෝගී වූ පුත්‍රයෙකු සිටි රාජ්‍ය නිලධාරියා ජීවත් වූයේ,

(1) කානා නුවරය. (2) කපර්ණවුමේ ය. (3) බෙතාවියේ ය. (4) ගලීලයේ ය.

10. සබත් දිනයේ සුවකළ රෝගියකු වන්නේ,

(1) කොර මිනිසෙක් ය. (2) අන්ධ මිනිසෙක් ය.

(3) අතක් පණ නැති මිනිසෙක් ය. (4) බිහිරි මිනිසෙක් ය.

11. ගෝලයන් ශුද්ධාත් ම බලය ලැබීමෙන් අනතුරුව කළ පළමු බලවත් ක්‍රියාව වන්නේ,

(1) කොර වූවකු සුව කිරීම ය. (2) බිහිරෙකු සුව කිරීම ය.

(3) ලාදුරු රෝගියකු සුව කිරීම ය. (4) අංශභාග රෝගියකු සුව කිරීම ය.

12. තබීතා ජීවත් වූ ගම වන්නේ,

(1) ගලීලය ය. (2) ජෙරුසලමය ය. (3) ජොප්පාවෙහි ය. (4) බෙතානිය ය.

13. කිතුනු සභාවේ ප්‍රථම වේද සාක්ෂිකයා වන්නේ,

(1) යොහන් ය. (2) ස්තේපන් ය. (3) පිලිප් ය. (4) ජුදත් ය.

14. මාංසික තෘෂ්ණා පිළිබඳ ව බයිබලයේ සඳහන් පොත වන්නේ,

(1) රෝමය ය. (2) එපීස ය. (3) ගලාති ය. (4) කොරෙන්ති ය.

15. ගෝලයන් වෙතට ශුද්ධාත් ම බලය ලැබුනේ,

(1) පාස්කු දින ය. (2) ඉරුදින ය.

(3) මහබ්‍රහස්පතින්දා ය. (4) පෙන්තකොස්ත දින ය.

16. කිතුනු දරුවකු තුළ තිබිය යුතු යහපත් ගුණාංගයක් වන්නේ,

(1) කරුණාව ය. (2) වෛර ය. (3) බෙදා ගැනීම ය. (4) සමාව නොදීම ය.

17. උපත්ථාදයකයන් පත්කරන ලද්දේ,

(1) දහම් දෙසීමට ය. (2) ශුභ සාධන කටයුතු සඳහා ය.

(3) රෝගීන් සුව කිරීමට ය. (4) යාච්ඤා කිරීමට ය.

18. ස්තේපන්ට ගල් ගැසූ තරුණයන්ගේ ඇඳුම් රැකබලා ගත්තේ,

(1) යොහාන් ය. (2) පිලිප් ය. (3) තෝමස් ය. (4) සාවුල් ය.

19. සාවුල් ව අන්ධව සිටි දින ගණන වන්නේ,

(1) පහක් ය. (2) හතරක් ය. (3) හතක් ය. (4) තුනක් ය.

20. ක්ෂණික ලාභ අපේක්ෂා කිරීම නිසා පිරිහීම ඇති වන්නේ,

(1) වංචාවන් කරන අය තුළ ය. (2) සොරකම කරන අය තුළ ය

(3) සූදුවට ඇබ්බැහි වූවන් තුළ ය. (4) බොරු කීමට යොමු වූවන් තුළ ය.

(ලකුණු 2 x20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (1) දේව මැවිල්ලේ අයිතිකරු හා භාරකරු කවුරුන් ද?

(2) නෝවාගේ පුතුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(3) කිතුනු දිවියේ වැදගත්ම සන්නිවේදන මාධ්‍ය කුමක් දැයි ලියන්න.

(4) ජේසුස් වහන්සේ සමඟ කානාහි සරණ මංගල්‍යයට සහභාගි වූයේ කවුරුන්දැයි ලියන්න.

(5) කිතුනු දරුවකු වන ඔබ යාච්ඤා කරන අවස්ථා දෙකක් ලියන්න.

(6) මිනිසාට ඇති දැනුම හා ඥාණය ගැන සඳහන් වන බයිබලයේ ඇති පොත කුමක්දැයි ලියන්න.

(7) සුදර්ශන දොරටුව ළඟ සිටි මිනිසා සුවපත් කළේ කවුරුන් දැයි ලියන්න.

(8) සාවුල් කිතුනුවන්ට පීඩා කිරීමට ගියේ කොතැන් සිට කවර ස්ථානයකට දැයි ලියන්න.

(ලකුණු 2 × 8 = 16)

02. (i) යාච්ඤාව යනු කුමක්දැයි ලියන්න. (ලකුණු 02)

(ii) ජේසුස් වහන්සේ නිරන්තරයෙන් යාච්ඤාව තම ජීවිතයට අදාළ කරගත් අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබගේ පවුලේ අයෙකු අසනීප වූ විට ඔබ කරන යාච්ඤාවක් ලියන්න. (පේළි හයක් පමණ)

(ලකුණු 06)

03. (i) දොර්කස් යන නමෙහි අර්ථය ලියන්න. (ලකුණු 02)

(ii) ඇය ජීවත්ව සිටින විට කළ යහපත් ක්‍රියා තුනක් ලියන්න. (ලකුණු03)

(iii) ශුද්ධාත්ම බලය කරණකොට ගෙන ඔබගේ ජීවිතයට සහනය ලැබුණු අවස්ථාවක් විස්තර කර ලින්න. (පේළි හයකින් පමණ) (ලකුණු 06)

04. (i) නව තාක්ෂණයේ ඉතා පුළුල් වූ මංපෙත් විවර කළ සන්නිවේදන මාධ්‍ය කුමක් දැයි ලියන්න.

(ලකුණු 02)

(ii) ඔබ නම් කළ සන්නිවේදන මාධ්‍යයෙන් මිනිසාට ඇති පහසුකම් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) මෙම සන්නිවේදන මාධ්‍ය නිසා මිනිසා මුහුණ දිය හැකි අයහපත් දේවල් හයක් ලියන්න.

(ලකුණු 06)

05. (i) ඔබ දන්නා මාංසික තෘෂ්ණා 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) බිමත්කම නිසා ඇතිවන හානි තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබ සඳහන් කල මාංසික තෘෂ්ණා වලින් වැලකී සිටීම සඳහා කිතුණු දරුවෙකු ලෙස ඔබ ගන්නා පියවර තුනක් කෙටියෙන් ලියන්න. (ලකුණු 06)

06. (i) දාවිත්ගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) දාවිත්ගේ ජීවිතයෙන් පිළිබිඹුවන ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) කිතුණු දරුවෙකු ලෙස ප්‍රේමයෙන් ක්‍රියාකල හැකි අවස්ථා හයක් ලියන්න. (ලකුණු 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 1 ) | 04. ( 2 ) | 05. ( 1 ) | 06. ( 2 ) | 07. ( 2 ) | 08. ( 3 ) | 09. ( 2 ) | 10. ( 2 ) |
| 11. ( 1 ) | 12. ( 3 ) | 13. ( 2 ) | 14. ( 3 ) | 15. ( 4 ) | 16. ( 1 ) | 17. ( 2 ) | 18. ( 4 ) | 19. ( 4 ) | 20. ( 3 ) |

ලකුණු = 1 - 8 = 1 x 2 = 36

ඉතිරිය 1 බැගින් 4

= 40

## II කොටස

01. (1) දෙවියන් වහන්සේ හා මිනිසා
(2) ශෙම්, හාම්, ජපෙත්
(3) යාච්ඤාව
(4) මැණියන් හා ගෝලයන්
(5) දවසේ ආරම්භයේ දී ..... ආදී පිළිතුරු
(6) හිතෝපදේශ
(7) පේදුරු හා ජොහාන්
(8) ජෙරුසලමේ සිට දවස්කයට (2 × 8 = 16)

02. (i) දෙවියන් වහන්සේ මිනිසා අතර ඇති සංවාදයකි, ගනුදෙනුවකි.
(ii) ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙර, ප්‍රාතිහාර්ය සිදු කිරීමට පෙර, සිය මෙහෙය ඇරඹීමට පෙර, දුක් ප්‍රාප්තියට මුහුණ දීමට පෙර
(iii) සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න. (2 + 3 + 6 = 11)

03. (i) තබීතා, මුවදෙන
(ii) දන්දීම, කමිස, තබා මසා දීම.
(iii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණ දෙන්න. (2 + 3 + 6 = 11)

04. (i) පරිගණකය, දුරකතනය ආදිය
(ii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.
(iii) සිසුවා ලියා ඇති පිළිතුරය අනුව ලකුණු ලබා දෙන්න. (2 + 3 + 6 = 11)

05. (i) වෛරස, ආරවුල්, ක්‍රෝධය (46 පිටුව)
(ii) පවුල් ආරවුල් ඇති වීම. / මුදල් නාස්තිය / රෝගාබාධවලට ගොදුරු වීම ආදිය
(iii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න. (2 + 3 + 6 = 11)

06. (i) එන්ගෙදියේ දි සාවුල්ගේ ජීවිතය බේරීම. / මෙපිබොෂෙප් කරුණාව දැක්වීම.
(ii) දේවභය, යටපහත්කම, පළිගැනීම වෙනුවට ප්‍රේමය දැක්වීම (7 පිටුව)
(iii) සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න. (2 + 3 + 6 = 11)